" විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "

# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
# பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
# OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk

පොදු දුරකථන / பொதுத் தொலைபேசி / General Telephone - 011 - 2093000

ISO 9001

SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

| මගේ අංකය / எனது இலக்கம் / My No. | CSWP/ADM/18-38/FI/01-2022 | ඔබේ අංකය / உமது இலக்கம் / Your No. | | දිනය / திகதி / Date | 2022.09.16 |
|---|---|---|---|---|---|

පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට අදාල පාලන චක්‍රලේඛ අංක 02/2022

ආණ්ඩුකාර ලේකම්(බ.ප.),
ලේකම්,පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.),
සභා ලේකම් (බ.ප.),
ලේකම්,(පළාත් පාලන/අධ්‍යාපන/කෘෂිකර්ම/ප්‍රවාහන/සෞඛ්‍ය) අමාත්‍යාංශය(බ.ප.),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/පිරිස් හා පුහුණු/මූල්‍ය/සැලසුම්/ඉංජිනේරු),
පළාත් ආදායම් කොමසාරිස් (බ.ප.)
අධ්‍යක්ෂ,අභ්‍යන්තර විගණන ඒකකය (බ.ප.)
ප්‍රධානනීති නිලධාරි, නීති ඒකකය (බ.ප.),
ප්‍රධාන ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්/පරිපාලන නිලධාරී,

<u>කාර්යක්ෂමතා කඩඉම් විභාග සම්බන්ධයෙන් සහන ලබා දීම.</u>

රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 03/2016 ට සමගාමීව මෙම පාලන චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

02. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 ට අනුකූලව සංශෝධිත සේවා ව්‍යවස්ථා හා බඳවා ගැනීමේ පටිපාටිවලට අනුව වසරකට දෙවරක් කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්විය යුතු අතර එසේ සංශෝධිත සේවා ව්‍යවස්ථාව හා බඳවා ගැනීමේ පටිපාටිවලට අනුකූලව, බඳවා ගනු ලබන නිලධාරීන් වසර 03 ක් ඇතුලත පළමු කාර්යක්ෂමතා කඩඉම ද, II වන ශ්‍රේණියට උසස් කරනු ලබන නිලධාරීන් උසස් වීම් දින සිට වසර 03 ක් ඇතුලත II වන කාර්යක්ෂමතා කඩඉම ද, I වන ශ්‍රේණියට උසස් කරනු ලබන නිලධාරීන් උසස් වීම් දින සිට වසර 05 ක් ඇතුලත III වන කාර්යක්ෂමතා කඩඉමද සම්පූර්ණ කල යුතුය.

03. එසේ වුවද, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 ට අනුකූලව සංශෝධිත සේවා ව්‍යවස්ථා හා බඳවා ගැනීමේ පටිපාටිවලට අනුව කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත පරිදි නොපැවැත්වීම නිසා ඇති වන ගැටලු සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි ක්‍රියා කිරීමට බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කර ඇත.

04. ඒ අනුව නියමිත සේවා ව්‍යවස්ථාවේ හෝ බඳවා ගැනීමේ පටිපාටියෙහි වසරකට කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පැවැත්විය යුතු වාර ගණන නිශ්චිත වශයෙන් සඳහන් කර ඇති නමුත්, නියමිත පරිදි විභාගය නොපැවැත්වීම මත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත කාලය තුළ සම්පූර්ණ කිරීමට නොහැකි වූ නිලධාරීන්ට ජ්‍යෙෂ්ඨත්වයට හානි නොවන පරිදි, කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සම්පූර්ණ කල යුතු කාල සීමාව තුළ සේවා ව්‍යවස්ථාවෙහි හෝ බඳවා ගැනීමේ පටිපාටියෙහි විධිවිධානවලට අනුකූලව පැවැත්වීමට නියමිතව තිබූ විභාග අවස්ථා සංඛ්‍යාවට සමාන අනුගාමී විභාග අවස්ථා සංඛ්‍යාවක් මගින් කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සම්පූර්ණ කල හැකිය.

05. ඉහත 03 ඡේදයට අනුකූලව කාර්යක්ෂමතා කඩඉම් සහන ලබා දීම් පහත අනුමැතිය පරිදි සිදු විය යුතුය.

| නිලධාරී ගණය | අනුමැතිය ලබා දිය යුතු නිලධරයන් |
|---|---|
| 01. දීප ව්‍යාප්ත සේවයට අදාළ නිලධරයින් | රාජ්‍ය සේවා කොමිෂන් සභාව/ අදාල බලධරයන් |
| 02. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව පත්වීම් බලධරයා වන SL වැටුප් බණ්ඩය දරණ නිලධාරීන් | බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව |
| 03. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 අනුව තෘතීය හා ද්විතීය මට්ටම්වලට අයත් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව පත්වීම් බලධරයා වන තනතුරු | බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව |
| 04. බස්නාහිර පළාත් සභා ගුරු තනතුරු | පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්/ බලතල පවරන ලද කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන් |
| 05. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 අනුව MT-1, MN-1 හා ප්‍රාථමික මට්ටමට අයත් PL වැටුප් බණ්ඩය දරණ තනතුරු | බලතල පවරන ලද බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් / පළාත් අමාත්‍යාංශ ලේකම්වරුන්/ පළාත් දෙපාර්තමේන්තු ප්‍රධානීන් |

06. කෙසේ වුවද උක්ත 03 ඡේදයේ විධිවිධාන අදාළ වනුයේ ලිඛිත, වාචික හා ප්‍රායෝගික පරීක්ෂණ සඳහා පමණි. හැකියා ප්‍රවර්ධනය වැනි පාඨමාලා කාර්යක්ෂමතා කඩඉම ලෙස සේවා ව්‍යවස්ථා හා බඳවා ගැනීමේ පටිපාටිවල සඳහන්ව ඇති නිලධාරීන්ගේ අදාළ කාර්යක්ෂමතා කඩඉම සම්බන්ධයෙන් වන සහන ඉල්ලීම සඳහා නිර්දේශ, නියමිත ආකෘති පත්‍රයෙන් බලතල පවරන ලද බලධරයන්, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කල යුතුය.

07. තවද ඉහත විධිවිධාන යටතට නොගැනෙන වෙනත් කාර්යක්ෂමතා කඩඉම සම්බන්ධයෙන් වන සහන ඉල්ලීම සඳහා අදාළ නිර්දේශ බලතල පවරන ලද බලධරයන්/ බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කල යුතුය.

බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ එකඟතාවය මත මෙම චක්‍රලේඛය නිකුත් කරන ලදී.

ජේ.එම්.සී.ජයන්ති විජේතුංග,
ප්‍රධාන ලේකම්,
බස්නාහිර පළාත.